# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — 83/ 2023

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2023.01.21
පැය 0530

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු මාධ්‍යන් හි පලකර ප්‍රචාරය කිරීම සඳහා යොමු කිරීම.**

01. මාරක රිය අනතුරක් - නානුඔය පොලිස් වසම.

2023.01.20 වන දින සවස් කාලයේ නානුඔය පොලිස් වසමේ හැටන් නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ රදැල්ල ප්‍රදේශයේදී නුවරඑළිය දෙස සිට හැටන් දෙසට ධාවනය වූ අධ්‍යාපන චාරිකාවක නිරතවෙමින් සිටි කොළඹ ප්‍රදේශයේ පාසල ඉගෙනුම ලබන සිසුන් පිරිසක් රැගත් බස් රථයක රියදුරුට රථය පාලනය කරගත නොහැකිව හැටන් දෙස සිට නුවරඑළිය දෙසට ධාවනය වූ වෑන් රථයක හා ත්‍රීරෝද රථයක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බස් රථය මාර්ගයෙන් ඉවතට පැන ප්‍රපාතයකට ගොස් ඇත.

**අනතුරින් වෑන් රථයේ ගමන් කල 06 දෙනෙකු හා ත්‍රීරෝද රථයේ රියදුරු මියගොස් ඇති අතර තුවාල ලැබූ 53 දෙනෙකු නුවරඑළිය රෝහලට ඇතුලත් කර ඇත.**

**මරණකරුවන් අතර වයස අවුරුදු 13 පිරිමි ළමයෙක්, අවුරුදු 26, 27 වයස්වල පසුවන පිරිමි පුද්ගලයින් 03 ක් , වයස අවුරුදු 08 සහ 12 ක් වන ගැහැණු ළමුන් 02 ක්, වයස අවුරුදු 43 ක කාන්තාවක් සිටින අතර ඔවුන් නානුඔය , හැටන් ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අනතුර සම්බන්ධයෙන් නානුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.